# ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම්...




ලෝක බැංකුව විසින් ලෝකයේ රටවල් ප්‍රධාන කාණ්ඩ හතරක් යටතේ ශ්‍රේණිගත කරන අතර, ඒ අනුව ඉහළ ආදායම්, ඉහළ මැදි ආදායම්, පහළ මැදි ආදායම් හා පහළ ආදායම් ලබන රටවල් ලෙස ලෝකයේ රටවල් ශ්‍රේණිගත කර තිබේ.

ඒකපුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව මෙම ගණනය කිරීම් සිදුකර තිබේ. පසුගිය වසරේ ජූලි 01 වැනිදා ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 3,840ක් බවත්, මේ වසරේ ජූලි 01 වැනිදා වනවිට ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 4,060ක් බවත් ලෝක බැංකුව නිකුත් කළ වාර්තාවේ දැක්වෙයි.

2019/07/01 වැනිදා වනවිට ඒකපුද්ගල ආදායම ඩොලර් 3,996 සිට 12,375ක් අතර පසුවන රටවල් ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස ලෝක බැංකුව වර්ගීකරණය කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම ඩොලර් 4,060ක් බවට පත්ව ඇති හෙයින් ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ග කර තිබේ.

ශ්‍රී ලංකාවට අමතරව කොසෝවෝ, ජෝර්ජියා යන රටවල් පහළ මැදි ආදායම් ලබන රටවල සිට ඉහළ මැදි ආදායම් ලබන රටවල් දක්වා ඉහළට ගොස් තිබේ. ආජන්ටිනාව ඉහළ ආදායම් ලබන රටක සිට පහළ මැදි ආදායම් ලබන රටක් දක්වා පහළ ගොස් තිබේ.

එසේම සිම්බාබ්වේ පහළ ආදායම් ලබන රටක සිට පහළ මැදි ආදායම් ලබන රටක් බවට වර්ධනය වී තිබේ.